සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

5 ශ්‍රේණිය
ශිෂ්‍යත්වය 2025

Siphala FROM SLTMOBITEL

Advanced Paper Class

පැය 1 යි.

ප්‍රශ්න පත්‍ර අංක 01

I - පත්‍රය

නම/ විභාග අංකය ....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් භාවිත කරන්න.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

Siphala FROM SLTMOBITEL

zoom

මෙම ප්‍රශ්න පත්‍ර කට්ටලයේ ප්‍රශ්න වැඩමුළුවක ආකාරයෙන් සවිස්තරාත්මක සාකච්ඡා කරන SLT Mobitel Adânced Paper Class එක සමග සම්බන්ධ වීමට සහ තොරතුරු දැන ගැනීමට අමතන්න. WhatsApp කරන්න. 077 7 261 864 | 071 999 51 31

ප්‍රශ්න පත්‍ර සම්පාදනය සහ දේශන දායකත්වය
මංජුල ගනේපොල
විද්‍යාවේදී විශේෂ පශ්චාත් උපාධි ඩිප්ලෝමා

01. පහත සඳහන් රූපවලින් නොගැළපෙන රූපය සහිත පිළිතුර තෝරන්න.



(1) A (2) C (3) D

02. 

මෙම රූපයේ සිටින ළමයා ගැන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ළමයාගේ දකුණු ඇසින් කඳුළු බිංදු වැටෙන අතර කොණ්ඩය මැදින් බෙදා ඇත.

(2) කොණ්ඩය පැත්තෙන් බෙදා ඇති අතර ළමයා දුක් වන අවස්ථාවකි.

(3) ළමයා සිනාසෙන මුත් දකුණු ඇසින් කඳුළු කඩා වැටේ.

03. 

මෙම රූපයේ ඇති සෘජුකෝණාස්‍ර ගණන කීය ද?

(1) 3

(2) 4

(3) 5

04. මුල් රූපයට සමාන රූපය පිළිතුරු අතරින් තෝරන්න.



(1) (2) (3)

05. 



මෙහි ? සඳහා අගය විය නොහැක්කේ මින් කුමක් ද?

(1) 176 (2) 98 (3) 22

06. යහළුවන් 4 දෙනෙක් එකතු වී එකිනෙකට වෙනස් කෙටි කෑම වර්ග තුනකින්, එක් අයෙකුට සෑම ආහාර වර්ගයකින් ම එක බැගින් මිල දී ගන්නා ලදී. ආහාරයට ගත් රෝල්ස්වලට වැය වූ මුදල පැටිස්වලට වැය වූ මුදල මෙන් දෙගුණයකි. පැටිස්වලට වැය වූ මුදල කට්ලට්වලට වැය වූ මුදල මෙන් දෙගුණයකි. සියළු ම ආහාර සඳහා වැය වූ මුදල රුපියල් 840.00 ක් නම් රෝල්ස් එකක මිල කීය ද?

(1) රුපියල් 60.00 (2) රුපියල් 120.00 (3) රුපියල් 160.00

07. රටාව අනුව ඊළඟට ආ යුතු රූපය තෝරන්න.



(1) (2) (3)

08. මෙම රූපයේ දැක්වෙන වාහනය සම්පූර්ණ කිරීමට යොදා ගත යුතු කොටස් සියල්ල ම ඇතුළත් පිළිතුර තෝරන්න.





(1) (2) (3)

09. රටාව අනුව ඊළඟට ආ යුතු රූපය තෝරන්න.

(1) (2) (3)

10.



සාගර, ඔක්සිජන් සහ සිසුර ආදී වශයෙන් පෞද්ගලික අධ්‍යාපන ආයතන 3ක් ඇති අතර එම එක් අධ්‍යාපන ආයතනයකින් කණ්ඩායම බැගින් ක්‍රිකට් සහ වොලිබෝල් ශූරතාවය සඳහා තරග වදී. ජයග්‍රහණ ලැබිය හැකි එකිනෙකට වෙනස් අවස්ථා ගණන කීය ද?

(1) 9 (2) 6 (3) 3

11.



ඉහතින් දැක්වෙන්නේ උද්‍යානයක ඉඳගැනීමට ඇති බංකු පේළියකි. මෙහි ඇති බංකු 4ක් සඳහා විදුලි පහන් කණුවක් බැගින් දැමිය යුතු අතර එහි දී වැඩයවන මුදල ද අවම කර ගත යුතුව ඇත. මේ සඳහා අවශ්‍ය කණු ගණන කීය ද?

(1) 2 (2) 3 (3) 4

12.



මෙම රූපයේ ඇති ත්‍රිකෝණ සංඛ්‍යාව කොපමණ ද?

(1) 11

(2) 10

(3) 8

13. 

කොටස් 8කට බෙදන ලද වෘත්තයක ළමයි පිරිසක් සිටින ආකාරය රූපයෙන් දැක්වේ. ගගනිගෙන් පටන් ගෙන ඔරලෝසුවේ කටු කරකැවෙන ආකාරයට 1, 2, 3 සහ නැවත 1, 2, 3 යන ආකාරයට ඉලක්කම් කියනු ලැබේ. මුලින් ම එක ම ඉලක්කම දෙවතාවක් ලැබෙන්නේ කාට ද?

(1) ගගනි (2) විචනායා (3) හෙසඳු

14. 

මෙහි ඇති විශාල ම සමචතුරස්‍රයෙන් කුඩා ම ප්‍රමාණයේ සමචතුරස්‍රය මෙන් උපරිම කීයක් කපා වෙන් කර ගත හැකි ද?

(1) 13 (2) 65 (3) 64

15. ඔරලෝසු මුහුණතක සටහන් කර ඇති එක ළඟ පිහිටි සංඛ්‍යා දෙක එකට එකතු කරනු ලැබේ. ලැබෙන අගය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සැමවිට ම ඔත්තේ සංඛ්‍යාවක් ලැබේ.

(2) ලැබෙන උපරිම අගය 13කි.

(3) ලැබෙන අවම අගය 2කි.

16. 

තේනුක 100g බැගින් වූ දත් බෙහෙත් පැකට් 21ක් මිලට ගන්නා ලදී. නමුත් එකක බර අනෙක් දත් බෙහෙත් පැකට්වල බරට වඩා අඩු බැව් ඔහු නිරීක්ෂණය කළේ ය. රූපයේ දැක්වෙන තරාදිය පමණක් උපයෝගී කොට ගෙන මෙම දත් බෙහෙත් පැකට්ටුව සොයා ගත යුතු ව ඇත. මේ සඳහා ඔහුට තරාදිය භාවිත කිරීමට සිදුවිය හැකි අවම වාර ගණන කීය ද?

(1) 1 (2) 10 (3) 5

17. පහත සඳහන් රූපවලින් කිසියම් හේතුවක් නිසා රූප දෙකක් නොගැළපේ. එම රූප දෙක සහිත පිළිතුර තෝරන්න.



(1) D හා F (2) E හා C (3) A හා B

18. දිදුල රුපියල් 60ක් වටිනා බනිසක් සහ තවත් ආහාර වර්ගයකින් දෙක බැගින් දිදුල මිල දී ගන්නා ලදී. මේ සඳහා දිදුල රුපියල් 500ක නෝට්ටුවක් ලබා දෙන ලදී. වෙළෙන්දා දිදුලගෙන් තවත් රුපියල් 20ක් ඉල්ලා ගෙන ඉතිරිය වශයෙන් රුපියල් 100 නෝට්ටු තුනක් ලබා දෙන ලදී. දිදුල මිල දී ගත් අනෙක් ආහාර ද්‍රව්‍යයේ එකක මිල කීය ද?

(1) රුපියල් 160.00 (2) රුපියල් 80.00 (3) රුපියල් 100.00

19. පාසලට දකුණින් බැංකුව පිහිටා ඇත. රෝහල පිහිටා ඇත්තේ පාසලට උතුරිනි. විදුලිබල මණ්ඩලය පාසලට නැගෙනහිර දිශාවෙන් පිහිටා ඇත. මේ අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) විදුලිබල මණ්ඩලයට දකුණින් බැංකුව හා පාසල පිහිටා ඇත.

(2) බැංකුවට උතුරින් රෝහල සහ පාසල පිහිටා ඇත.

(3) රෝහලට දකුණු පසින් විදුලිබල මණ්ඩලය සහ බැංකුව පිහිටා ඇත.

20. ඊතලය ඇති දිශාවෙන් මුහුණ බලන කණ්ණාඩියක් ඇල්ලූ විට නොවෙනස් ව පෙනෙන රූපය සහිත පිළිතුර තෝරන්න.


(1)


(2)


(3)

21. මෙම රටාව සාදා ඇත්තේ එක සමාන ගිනිකූරු උපයෝගී කොට ගෙන ය. එනම් A රූපය සෑදීමට ගිනිකූරු 3ක් යොදා ගෙන ඇත. මේ අනුව D ස්ථානයට ඇති හැඩය සෑදීමට C රූපයට වඩා අවශ්‍ය අමතර ගිනිකූරු ගණන කීය ද?


A B C

(1) 30 (2) 12 (3) 16

22. 1 රූපයේ පරිදි කඩදාසි ත්‍රිකෝණයක් ගෙන කඩ ඉරි ඔස්සේ නවා ලැබෙන රූපය 2 රූපයේ ඇති කඩ ඉරි ඔස්සේ කපා, දිගහැර බැලූ විට ඉන් වෙන්කර ගතහැකි ත්‍රිකෝණ ගණන හා චතුරස්‍ර ගණන පිළිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,


1 රූපය


2 රූපය

(1) 3, 3 (2) 1, 1 (3) 1, 2

23. ටෂාරා රෝස සහ පිච්ච මල්වලට කැමති නමුත් අරලිය මල්වලට කැමති නැත. අයුනි පිච්ච මල්වලට කැමති ය. රුවිදි අකමැති වන්නේ වතුසුදුවලට පමණි. මේ අනුව තිදෙනා ම කැමති මල් වර්ගය කුමක් ද?

(1) පිච්ච (2) රෝස (3) අරලිය

24. A ලෙස දක්වා ඇති රූපයෙන් B ලෙස දක්වා ඇති කොටස ඉවත් කළ විට ලැබෙන රූපය තෝරන්න.


A


B


(1)


(2)


(3)

25. මෙම කොටු ජාලය හොඳින් නිරීක්ෂණය කරන්න. එම ජාලයේ හරහට හෝ පහළට එක ළඟ ඇති ඉලක්කම් දෙකක් එකතු කළවිට අගය 8ට වැඩි වන අවස්ථා ගණන කීය ද?

8	4	3	2
7	2	4	4
1	5	2	6

(1) 4 (2) 6 (3) 10

26. යන්ත්‍රයක 1 සිට 10 තෙක් ඇති ඔත්තේ සංඛ්‍යා පමණක් ලියා ඇති බෝල විශාල සංඛ්‍යාවක් ඇත. මෙම බෝල මිශ්‍ර වී අහඹු ලෙස එක් බෝලයක් එළියට පැමිණේ. දැන් එම බෝලයේ ඇති සංඛ්‍යාව එම සංඛ්‍යාවෙන් ම ගුණ වී අගය ලැබේ. මෙලෙස ලැබිය හැකි විශාල ම සහ කුඩා ම සංඛ්‍යාව පිළිවෙළින් ලියා ඇති පිළිතුර තෝරන්න.

(1) 81, 1 (2) 81, 4 (3) 121, 1

27. එක්තරා විලක සැල්වීනියා විශේෂයක් දවසට දෙගුණයක වේගයෙන් වර්ධනය වේ. දින 20ක් අවසානයේ මෙම සැල්වීනියා විශේෂය මුළු විල පුරාම පැතිරී තිබුණි නම්, විලෙන් හතරෙන් එකක් මෙම සැල්වීනියා විශේෂය පැතිරීමට කොපමණ දින ගණනක් ගතවේ ද?

(1) දින 5 යි (2) දින 10 යි (3) දින 18 යි

28. සිසුන් විස්සක කණ්ඩායමක් එක් පේළියකට පහ බැගින් සිටින සේ කණ්ඩායම්වලට බෙදන ලදී. පසුව ඔවුන්ට 1, 2, 3, 4, ... පිළිවෙළට අංක යෙදූ කාඩ්පත් ලබා දෙන ලදී. ඉන් තීර දෙකක කාඩ්පත් අංක පහත දැක්වේ.

	1 පේළිය	2 පේළිය	3 පේළිය	4 පේළිය
තීරය 1	1	2	3	4
තීරය 2	5	6	7	8

පළමු පේළියේ සිසුන් තුන්වැනි පේළියටත් තුන්වැනි පේළියේ සිසුන් පළමු පේළියටත් ස්ථාන මාරු කරගන්නා ලෙස ගුරුතුමා විධානයක් දෙන ලදී. ඒ අනුව 3 වන පේළියේ 4වන තීරයේ සිසුවාගේ අංකය කීය ද?

(1) 10 (2) 13 (3) 15

29. 

විසිත්ත කාමරයක ඇති රාක්කයක් මෙම රූපයෙන් දැක්වේ. මෙහි ඡායාරූපයක්, ක්‍රිකට් පිත්තක්, ක්‍රිකට් බෝලයක් සහ කුඩා මල් පෝච්චියක් A, B සහ C කොටස්වල තැබිය යුතු ය. මෙම A, B, C යන කොටස් හිස් නොතිබිය යුතු අතර ක්‍රිකට් පිත්ත සහ ක්‍රිකට් බෝලය එක ම කොටසේ තැබිය යුතු ය. මේ අනුව ඉහත ද්‍රව්‍ය තැබිය හැකි එකිනෙකට වෙනස් ආකාර කීයක් තිබේ ද?

(1) 10 (2) 6 (3) 8

30. 

රූපයේ දැක්වෙන ඝනකාභයක හැඩයේ ලී කුට්ටිය 10cm බැගින් වූ ඝනක උපරිම ප්‍රමාණයක් එන ලෙස කොටස්වලට කපා ලැබෙන කොටස් තිත් ඉරි දිගේ දක්වා ඇති ආකාරයට කැපී යන ආකාරයට නැවත කපනු ලැබේ. දැන් මෙහි ඇති කුඩා ඝනක ගණන කීය ද?

(1) 24 (2) 36 (3) 18

31. 

රූපයේ දැක්වෙන සමමිතික මාර්ගය ඔස්සේ ඇෆ්රෙෂ්නා A හි සිට B, C හරහා D තෙක් ද, නිසඳි F හි සිට D හරහා C තෙක් ද පැමිණේ. දෙදෙනා ගමන් ආරම්භ කරන්නේ එක ම මොහොතක දී වන අතර දෙදෙනා C හා D ස්ථාන දෙක අතර හරි මැද දී හමුවේ. මේ අනුව වැඩි ම දුරක් ගමන් කළ ළමයා ගමන් කළ දුර කොපමණ ද?

(1) 30m (2) 25m (3) 35m

32. ගං වතුර ආධාර වශයෙන් ලබා දුන් වියළි ආහාර ලෙස අසුරන ලද පෙට්ටි යම් ප්‍රමාණයක් සෑම ගමකට ම සමාන පෙට්ටි ප්‍රමාණයක් බැගින් ලැබෙන සේ පෙට්ටි 400ක් බෙදා ගන්නා ලදී. එවිට පෙට්ටි 50ක් ඉතිරි විය. මෙලෙස බෙදා දුන් ගම් ගණන කීයක් විය හැකි ද?

(1) 6 (2) 7 (3) 8

33. රාත්‍රී භෝජන සංග්‍රහයක් සඳහා මිතුරන් පිරිසක් හමුවිය. එය අවසානයේ දී තම තමන්ගේ තොරතුරු වෙන වෙනම කාඩ් පතක ලියා දෙන ලෙස සහභාගී වූ සෑම අයෙකුට ම පවසා, එම තොරතුරු පැමිණ සිටි එකිනෙකා අතරේ හුවමාරු කර ගන්නා ලදී. මෙම තොරතුරු ලිවීමට කාඩ්පත් 168ක් සහිත මිටියකින් $\frac{1}{4}$ ක් වැය විය. රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා පැමිණි පිරිස කොපමණ ද?

(1) 42 (2) 6 (3) 7

34. එක ළඟ පිහිටි සංඛ්‍යා අනුයාත සංඛ්‍යා ලෙස හැඳින්වේ.

A - ඕනෑම අනුයාත සංඛ්‍යා තුනක එකතුව තුනෙන් බෙදූ විට මැද පිහිටි සංඛ්‍යාව ලැබේ.

B - ඕනෑ ම අනුයාත සංඛ්‍යා තුනකින් දෙපස පිහිටි සංඛ්‍යා දෙක එකට එකතු කර දෙකෙන් බෙදූ විට මැද පිහිටි සංඛ්‍යාව ලැබේ.

ඉහත ප්‍රකාශ අනුව සෑම විට ම සත්‍ය වන්නේ,

(1) A පමණි (2) B පමණි (3) A හා B යන දෙක ම සත්‍ය වේ.

35. 

සමචතුරස්‍රාකාර කඩදාසියක් නවා එක් සිදුරක් විද කපා දිග හැරිය විට ලැබුණු රූපය මෙහි දැක්වේ. එම රූපය ලබා ගැනීමට කඩදාසිය නැවිය යුතු අවම වාර ගණන කීය ද?

(1) 3 (2) 4 (3) 5

36. පෙට්ටි තුනක නිල් පැහැති සහ කොළ පැහැති බෝල පමණක් මිශ්‍රව ඇත. එම පට්ටිවල ඇති මුළු බෝල ගණන 50, 57, 58 බැගින් වේ. ඉන් එක් පෙට්ටියක පමණක් එක් බෝල වර්ගයකට 3ක් අඩුවෙන් අනෙක් බෝල වර්ගය ඇත. එම පෙට්ටියේ ඇති බෝල ගණන කීය ද?

(1) 50 (2) 57 (3) 58

37. 

මෙහි දැක්වෙන ආකාරයේ ව්‍යායාම මං තීරු තුනක් ඇත. මෙම මං තීරුවල සමචතුරස්‍රාකාර කොටස් දෙක එක සමාන වන අතර සෘජුකෝණාස්‍රාකාර මං තීරුවේ දිග සමචතුරස්‍රාකාර මං තීරුවේ දිග මෙන් දෙගුණයකි. පළල සමාන වේ. සමචතුරස්‍රාකාර මං තීරුවේ ඒකාකාරී වේගයෙන් ඇවිද යාමට පුද්සරට මිනිත්තු 16ක් ගත වේ. එම වේගයෙන් ම සෘජුකෝණාස්‍රාකාර මං තීරුවේ ඇවිද යාමට ඔහුට ගතවන කාලය කොපමණ ද?

(1) මිනිත්තු 24 (2) මිනිත්තු 32 (3) මිනිත්තු 28

38. සමචතුරස්‍රාකාර මාර්ගයේ එක වටයක දුර 400m කි. තිත් යොදා ඇති ස්ථාන පසුකරමින් පිටතින්ම ඇති මාර්ගය වටා එක් වටයක් ඇවිද යාමේ දී ගමන් කරන දුර කොපමණ ද?

(1) 400m (2) 900m (3) 1000m

39. 

ABCD යනු සෘජුකෝණාස්‍රාකාර ඉඩමකි. මින් රූපයේ දැක්වෙන ආකාරයට ඉඩම් කට්ටි 4ක් විකුණා දමන ලදී. ABCD බිම් කැබැල්ලේ වටේ දිගත් ඉඩම් කැබලි විකිණූ පසු ඉතිරි වන කොටස් වටේ දිගත් අතර වෙනස ගැන කිව හැක්කේ කුමක් ද?

(1) වෙනසක් ඇත. (2) වෙනසක් නැත. (3) ස්ථිර ව කිව නොහැක.

40. 

මෙම අක්ෂර යෙදී ඇති ආකාරය අනුව CHOKE සඳහා ගැළපෙන රූපය තෝරන්න.

(1)

(2)

(3)

(ලකුණු 2½ × 40 = 100)

* * * * *